

# මට නැති සුදුසුකමක් ඒ අයට ඇති

## අංජලී ලියනගේ

**අංජලීට නිළියක් වෙන්න හිතුනේ ඇයි?**

මට නිළියක් වෙන්න ඕන කියන බලාපොරොත්තුව හිතේ තිබ්බෙ නැහැ. සුජීව ප්‍රසන්න ආරච්චි මහතාගේ පළමු නවකතා පොත 'බොඳ මීදුම්' පොතේ කවරය වෙනුවෙන් පෙනී හිටියේ මම. ඇත්තටම එතැනින් මාව ගොඩක් දෙනෙක් අඳුර ගත්තා. කොහේ ගියත් මිනිස්සු ඒ නව කතාවේ ප්‍රධාන චරිතය 'සංසලා' කියන නමිනුයි මට කතා කලේ. ඒ ප්‍රතිචාර අසමිතයි. මට හිතුනා පොතේ පිට කවරයකට මෙහෙම නම් ප්‍රතිචාර, ආදරය ලැබෙනවානම් නිළියක් වුනාම ඒ දේ වැඩිවෙනවනේ කියලා, ඒ සිතිවිල්ලත් එක්ක තමයි මම රංගනයට පිවිසේන්නේ.

**නිළියක් වීම ගැන සතුටුද?**

ඔව්, අවංකවම සතුටුවෙනවා. පාර තොටක බැහැලා යනකොට ලැබෙන සුහදකම ලෙන්ගතුකම එක්ක ඒ සතුටු වැඩි වෙනවා.

**හැම නිළියක්ටම අංජලීට ලැබෙන යහපත් ප්‍රතිචාරම ලැබෙනවා කියලද හිතන්නේ?**

නැහැ. අපි ක්ෂේත්‍රයේ හැසිරෙන විදිහ, අපේ හැදියාවන් ගැන මැවෙන ප්‍රතිරූපයන් එක්ක ඒ ප්‍රතිචාර, පිලිගැනීම් වෙනස් වෙනවා.

**අංජලී ජනප්‍රියයි කියලද හිතන්නේ?**

යම් ප්‍රමාණයකට ජනප්‍රියයි කියලා හිතෙනවා.

**මේ වෙනකල් කිසිම ටෙලි සම්මාන උළෙලකට ආරාධනා ලැබිලා නැහැ කියලා කතාවක් තියෙනවා**

ඒක නම් ඇත්ත, ඒ ගැන නම් පොඩි දුකක් නැතුවමත් නෙවෙයි, ටෙලි සම්මාන උළෙලවල් වලට කවදාවත් මට ආරාධනා පත්‍රයක් ලැබිලා නැහැ.

**අංජලීට පස්සෙ ක්ෂේත්‍රයට ආව මුහුනු ඕනතරම් ඒ සම්මාන උළෙලවල් සඳහා ආරාධනා ලැබිලා තියෙනවා අපි දැකලා තියෙනවා.**

මට නැති සුදුසුකමක් ඒ අයට ඇති.

**වර්තමානයේ නිළියන් අතර ගැටුම් ඇතිවන්නේ ඇයි?**

අනේ මන්දා, සමහර දේවල් දකිද්දී පුදුම පිළිකුලක් දැනෙන්නේ.නළු නිළියෝ කියන්නේ විශේෂිත කොටසක්. ඒ අයගෙන් සමාජයට ඇතිවෙන්න ඕන ආකර්ෂණයක්, ආදරයක්, පිළිගැනීමක් මිස පිළිකුලක්, අප්පිරියාවක් නෙවෙයි. අද නළු නිළියන්ව ප්‍රේක්ෂකයෝ මායිම් නොකරන තැනට ඇවිත් තියෙන්නෙ එයාලගෙම හැසිරීම් නිසා කියලා හිතෙනවා.

**අංජලීගේ වෘත්තීය රගපෑමද?**

දැනටනම් එහෙම තමයි, අනාගතයේදී මගේම කියලා ව්‍යාපාරයක් පුංචියට පටන්ගන්න හිතාගෙන ඉන්නවා.

**නිළි වෘත්තීය අස්ථාවරද?**

එහෙම දැනුන තැන් තිබිලා තියෙනවා, අනික අපි වයසින් මුහුකුරා යනකොට අපිට එකම විදියට ආරාධනා ලැබෙන්නෙ නැහැ, ඉතින් එතැනදී ජීවත්වෙන්න පුළුවන් යහපත් වටපිටාවක් ගොඩ නැගිලා තියෙන්න ඕනනෙ.

**තරුණියක් විදියට ජීවිතය ගැන තෘප්තිමත්ද?**

ජීවිතය කියන්නේ හිම්වීම්, ජයග්‍රහණ විතරක්ම නෙවෙයි කියන අවබෝධය මට තියෙනවා. සතුට වගේම දුකත්, හිම්වීම්, අහිම්වීම් මේ හැමදෙයක් දිහාම උපේක්ෂාවෙන් බලා ඉන්න පුළුවන් හිතක් මට තියෙන නිසා ජීවත්වෙන්න ලේසියි.

**ඉදිරි රගපෑම් කටයුතු මොනවාද?**

නිල්වලා නිශ්පාදනය කරන සදුන් රාජකරුණාගේ අධ්‍යක්ෂණයක් වන 'ආදර වැස්ස' මේ දිනවල විකාශය වෙනවා. ඒ වගේම බුද්ධිනී ජයවර්ධනගේ 'සද කිදුරී මං' නව කතාව ඇසුරින් නිර්මාණය වුන 'මේ මමයි' ටෙලිනාට්‍ය විකාශයට නියමිතයි. එහි 'සෙව්වන්දි' කියන මම නිරූපණය කළ චරිතයට මං හුගාක් ආදරෙයි. මෙතෙක් නොකළ වෙනස් ආදරණීය චරිතයක් ඒක.

**බුද්ධිනී ජයවර්ධන**